කොළඹ දිසා අධිකරණයේ දී

හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ්,
හිල්ටන් ප්‍රොපර්ටීස් කම්ප්ලෙක්ස්,
ඇචිලන් චතුරශ්‍රය, ලෝටස් පාර,
කොළඹ 01.

පැමිණිලිකරු

නඩු අංකය: 15322/එම්.ආර්.

- එදිරිව -

නිහාල් ශ්‍රී අමරසේකර,
කොමින්ටැක්ස් මැනේජ්මන්ට් සර්විසස් ලිමිටඩ්,
167/4, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

විත්තිකරු

කොළඹ 1, ලෝටස් පාර, ඇචිලන් චතුරශ්‍රය, හොටෙල් ඩිවලපර්ස් ලංකා ලිමිටඩ් හි කෝනල් ලයනල් පෙරේරා වන මම ක්‍රිස්තියානි භක්තිකයෙකු ලෙස පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කර සිටිමි.

01. මම ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක සහ පැමිණිලිකාර සමාගමේ සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂක වන බවත්, පහත සඳහන් කරුණු මාගේ පුද්ගලික දැනුමෙන් දිවුරා ප්‍රකාශ කර සිටින බවත් මා ප්‍රකාශ කර සිටිමි.

02. මෙම නඩුවෙහි පැමිණිලිකාර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයද, වර්තමාන රජයෙන් නම් කල අධ්‍යක්ෂකවරුන් 6 දෙනාගෙන් දෙදෙනකු වන සුරේන් වික්‍රමසිංහ සහ ඒ.එස්.එම් පෙරේරා යන මහතුන් මගින් පමණක් පිළිතුරු සැපයීම සඳහා ඉහත නම් සඳහන් විත්තිකරු විසින් ඉදිරිපත් කර ඇති ප්‍රශ්න විචාරක සියල්ල විත්තිකරු විසින් අසත්භාවයෙන් සහ ද්වේශ සහගත ලෙස ඉදිරිපත් කර ඇති බව මම ප්‍රකාශ කර සිටිමි.

03. තවද එකී විචාරක සියල්ල සිවිල් නඩු විධාන සංග්‍රහයේ 98 වන වගන්තිය ප්‍රකාර ගරිඝතිය බවත් සහ/හෝ කාරණයට අදාල නොවන බවත් සහ/හෝ මේ අවස්ථාවේදී ප්‍රමාණවත් තරම් වැදගත් නොවන බවත් මම ප්‍රකාශ කර සිටිමි.

04. තවද භරයේ ප්‍රශ්න වලදී පැමිණිලිකාර සමාගම හෝ පැමිණිලිකාර සමාගම

වෙනුවෙන් ඉදිරිපත් වන සාක්ෂිකරු හෝ කරුවන්ගෙන් ඇසිය යුතු සහ/හෝ ඇසිය හැකි කරුණු ප්‍රශ්න විචාරන මගින් මේ අවස්ථාවේ ඉදිරිපත් කිරීමට විත්තිකරුට හිමිකම් නැති බව මම ප්‍රකාශ කර සිටිමි.

05. තවද විත්තිකරු ඉදිරිපත් කර ඇති විචාරන මගින් විත්තිකරු තොරතුරු සෙවීමේ කාර්යයක යෙදී සිටින බවත්, එසේ කිරීමට විත්තිකරුට හිමිකම් නැති බවත් මම ප්‍රකාශ කර සිටිමි.

06. එකී ප්‍රශ්න විචාරන සහ එහි පිළිතුරු සැපයීමට නම් කර ඇති සුරේන් වික්‍රමසිංහ සහ ඒ.එස්.එම්. පෙරේරා යන දෙදෙනා විත්තිකරු පක්ෂපාති රජය විසින් පත්කරන ලද අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු නිසා, එකී විචාරන සඳහා විත්තිකරුට පක්ෂපාති පිළිතුරු ලබා ගැනීමේ වංචනික සහ/හෝ ද්වේශසහගත සහ/හෝ අසත්භාවකීය චේතනාවකින් විත්තිකරු ඉදිරිපත් කර ඇති බවත් මම ප්‍රකාශ කර සිටිමි.

07. මෙකී කරුණු අනුව එකී ප්‍රශ්න විචාරන වලට පැමිණිලිකාර සමාගම උත්තර සැපයීමට බැඳී නැති බවත් සහ/හෝ උත්තර සැපයීමට ප්‍රතික්ෂේප කළහැකි බවත් මම ප්‍රකාශ කර සිටිමි.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය කියවා )
තේරුම්කර දීමෙන් පසු එය අවබෝධ )
කරගෙන වර්ෂ 1995 ක්වූ ජූනි මස )
15 වන දින කොළඹ දී දිවුරා )
අත්සන තබන ලදී.-------------- )

මා ඉදිරිපිට දීය

සාම විනිසුරු.